**2021 මාර්තු මස 19 වන දින පැවති**

**තිස් පස් වන මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව**

**දිනය :-2021.03.19**
**ස්ථානය :- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**
**වේලාව :- පෙ.ව 10.00**
**සහභාගී වූ :-**

| | | | |
|---|---|---|---|
| **01.** | ගරු සභාපති | එස්.බී කුමාරදාස මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **02.** | ගරු උප සභාපති | එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **03.** | ගරු මන්ත්‍රී | කේ.ඒ ශාන්ත මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **04.** | ගරු මන්ත්‍රී | බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **05.** | ගරු මන්ත්‍රී | බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **06.** | ගරු මන්ත්‍රී | කේ.ඒ සංජීව මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **07.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ ජයවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **08.** | ගරු මන්ත්‍රී | එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **09.** | ගරු මන්ත්‍රී | පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **10.** | ගරු මන්ත්‍රී | පී.ටී සිරිසේන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **11.** | ගරු මන්ත්‍රී | ආර්.එම් කුමාරසිංහ මැතිතුමා | ( එ.ජා.ප) |
| **12.** | ගරු මන්ත්‍රී | ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය | ( එ.ජා.ප) |
| **13.** | ගරු මන්ත්‍රී | ජී.ඒ නෙළුම් මැතිනිය | ( එ.ජා.ප) |
| **14.** | ගරු මන්ත්‍රී | ඩී.එම්.එන් සුභාෂිණී බංඩාර මැතිනිය | ( එ.ජා.ප) |
| **15.** | ගරු මන්ත්‍රී | එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **16.** | ගරු මන්ත්‍රී | කේ. හැරිසෙන්ස් මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **17.** | ගරු මන්ත්‍රී | ඩී.පී බන්දුලසේන මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **18.** | ගරු මන්ත්‍රී | පී කරුණාරත්න මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **19.** | ගරු මන්ත්‍රී | වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා | (ස්වාධීන කණ්ඩායම) |

**දන්වා සහභාගී නොවූ:-**

| | | | |
|---|---|---|---|
| **20.** | ගරු මන්ත්‍රී | එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා | ( එ.ජා.ප) |
| **21.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත සුභ උදෑසනක් ප්‍රාර්ථනය කරමින් ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගනිමින් න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**අ) මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.**

<u>2020.02.19 මහ සභා කෙටුම්පත් වාර්ථාව</u>

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2021.02.19 වන දින පැවැත් වූ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ඔබ වෙත ලැබීමට සළස්වා ඇති බැවින් එම වාර්ථාවේ අඩුපාඩු ඇත්නම් සංශෝධනයන්ට යටත්ව හෝ සංශෝධන නොමැති නම් සංශෝධන රහිතව වාර්ථාව සභා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් 2021.02.19 මහ සභා කෙටුම්පත් රැස්වීම් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> 2021.02.19 දින පැවති කෙටුම්පත් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම්.අයි ජනක ශ්‍රිමාලි මැතිනිය පෙ.ව 10.05 ට මහ සභාවට පැමිණ අසුන් ගන්නා ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> අද දින ලේකම් තුමා සභාවට පැමිණ නොසිටින බැවින් සභාවේ ලේකම් වරිය ලෙස තාවකාලිකව රාජකාරි ආවරණය කිරීම සඳහා ලේකම්වරයෙකු පත් කර ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> ලේකම්තුමා විශේෂ රාජකාරි කටයුත්තක් සඳහා සහභාගී වූ බැවින් මෙදින මහ සභාවට සහභාගී නොවන නිසා ඒ සඳහා තාවකාලික ලේකම්වරිය ලෙස සභා රැස්වීමේ රාජකාරි ආවරණය කිරීම වෙනුවෙන් ප්‍රධාන කළමණාකරන සහකාර තමරා නන්දනී අමරතුංග මහත්මිය නම් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා</u> එම යෝජනාව ස්ථිර කරන ලද අතර ඒ අනුව තාවකාලික ලේකම්වරිය ලෙස සභා රැස්වීමේ රාජකාරි ආවරණය කිරීම වෙනුවෙන් ප්‍රධාන කළමණාකරන සහකාර තමරා නන්දනී අමරතුංග මහත්මිය නම් කෙරිණි.

<u>සංශෝදන</u>

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> ගිය වර මහ සභාවේදී ගරු සභාපති තුමා විශේෂ රැස්වීමක් සඳහා සහභාගී වී සිටින බැවින් අද දින සභාවේ සභාපති ධූරයේ රාජකාරි ගරු උප සභාපතිතුමා විසින් සිදු කරනු ලබන බවට සභා වාර්ථාවේ මුලින් සඳහන් වී සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

තවද ගරු උප සභාපතිතුමා විසින් ගරු සභාපති ධූරයේ රාජකාරි ආවරණය කල බැවින් තීන්දු තීරණ සටහන් කිරීමේදී එය ගරු සභාපතිතුමා ලෙසට සඳහන් විය යුතු වුවත්, සෑම තීරණයක්ම ගරු උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කල බවට සඳහන් වන බවත්, එය සංශෝධනය විය යුතු බවත්, සඳහන් කරන ලදී.

එහිදී ගරු සභාපතිතුමා ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව සභාපතිවරයා සභාවේ නොමැති අවස්ථා වලදී, ගරු උප සභාපතිතුමා රාජකාරි ආවරණය කල යුතු බවට සඳහන් වන බැවින් ඉහතින් කල සංශෝධනය ප්‍රකාරව ගරු සභාපතිතුමාගේ රාජකාරි ආවරණය කිරීම ගරු උප සභාපතිතුමා විසින් සිදු කරනු ලබන බවට සඳහන් වන හෙයින් එම සංශෝධනය පමණක් සිදු කිරීම ප්‍රමාණවත් බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා කාර්යාලය සඳහා අභ්‍යන්තර දුරකථන ජාලය හඳුන්වා දීම සම්බන්ධයෙන් තමන් යෝජනා ඉදිරිපත් කළේ, 2014 වර්ෂයේ සිට වුවත්, යන ප්‍රකාශය කාර්යාලය සඳහා අභ්‍යන්තර දුරකථන ජාලය හඳුන්වා දීම සම්බන්ධයෙන් තමන් යෝජනා ඉදිරිපත් කළේ, 2002 වර්ෂයේ සිට වුවත්, ලෙසට සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

තවද ගෙවීම් වාර්ථාවේ සේවක වැටුප් , පරිපාලන වියදම් , සභික දීමනා හැර අනෙකුත් ගෙවීම් සඳහා විරුද්ධ වන බව තමන් විසින් ප්‍රකාශ කලා වුවත්, එය සභා වාර්ථාවේ සඳහන් නොවන බැවින් එය ඇතුලත් වී සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

ඒ අනුව 2021.02.19 වන දින පැවති මහ සභා කෙටුම්පත් වාර්ථාව ඉදිරිපත් වූ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

**ආ) සභාපතිතුමන් විසින් කරනු ලබන විශේෂ නිවේදන.**

**01. නිවාඩු දැනුම් දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මන්ත්‍රී එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා, ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා මහ සභාවට නොපැමිණෙන බවට දන්වා යොමු කර තිබූ නිවාඩු ඉල්ලීම් ලිපි මහ සභාවට නිවේදනය කරන ලදී.

**02. රැකියාවක් ලබා ගැනීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අංක 165/ඒ, ලී මෝල පාර, කවරක්කුලම, ගල්කුලම ලිපිනයේ පදිංචි පී.ඩබ් අකිල නිමේෂ් යන අය විසින් තමා රැකියාවක් නොමැතිව සිටනි බැවින් තමා හට ස්ථිර හෝ අනියම් රැකිවයාවක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙසට කර ඇති ඉල්ලීම මහ සභාවට නිවේදනය කරන ලදී.

**ඇ) ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන**

**01. රජයට අයත් නල ළිඳ සංරක්ෂණය කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අංක 124, තිස්ස මාවත, විජයපුර, අනුරාධපුර ලිපිනයේ පදිංචි සී කරුණාරත්න මහතා විසින් විජයපුර තිස්ස මාවත හන්දියේ පිහිටි රජයේ ළිඳ ජලය නොසිදෙන ගැඹුරු ළිඳක් වන අතර මෙහි ප්‍රාදේශීය සභාවෙන් දැල් වැටක්ද ඉදි කර ඇති අතර මෙය වසා දැමීමේ උත්සහයක යෙදෙන බවටද පෙනී යන බැවින් ඒ සම්බන්ධව අවධානය යොමු කර ළිඳ ආරක්ෂා කර දීමට කටයුතු කරන ලෙසට දන්වා ඇති ලිපිය මහ සභාවට ඉදිරිපත් කරන ලද අතර ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීම සඳහා ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා වෙත ඉල්ලීම් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා මෙම ළිඳ පොදු ළිඳක් බවත්, මේ වන විට ළිඳට කුණු දමා වැසීමට උත්සහයක් යෙදෙන බවට දක්නට ලැබෙන බැවින් ළිඳ උඩින් ආවරණයක් යොදා සකස් කර දෙන ලෙසට ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අදාල ළිඳ පරීක්ෂා කර බලා සුදුසු පියවරක් ගත යුතු බවත්, ඒ සඳහා තමන් මැදිහත් වන බවත් සඳහන් කරන ලදී.

**02.** **සඳගම දෙවන පටුමඟ පිළිසකර කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අංක 5/3, තම්මැන්නාපුර, ඥාණික්කුලම ලිපිනයේ පදිංචි බී.ජුඩ් ලක්ෂ්මන් මෙන්ඩිස් යන අය විසින් සඳගම මාර්ගය දෙපස ජීවත් වන පුද්ගලයින් 07 දෙනෙකුගේ අත්සන් සහිතව සඳගම අතුරු මාර්ගය භාවිතා කිරීමට නොහැකි තත්වයේ පවතින බැවින් පිළිසකර කර දීමට කටයුතු කරන ලෙසට දන්වා යොමු කර ඇති ලිපිය මහ සභාවට ඉදිරිපත් කර ඒ සම්බන්ධයෙන් සොයා බලා සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා බව දැන්වීය.

**ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

**නැත**

**ඉ) යථා පරිදී කල් දී ඇති යෝජනා**

**01.** **මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2021.03.05 වන දින පැවති මුදල් කමිටුව මගින් ලබා ගත් පහත සඳහන් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**I.** **ප්‍රාදේශීය සභාවට අයත් බ්ලොක් ගල් නිෂ්පාදන වැඩපල සඳහා අවශ්‍ය චිප්ස් සමඟ ගල්කුඩු මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභාවට අයත් බ්ලොක් ගල් නිෂ්පාදන වැඩපල සඳහා අවශ්‍ය චිප්ස් සමඟ ගල්කුඩු මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති කුරුණෑගල පාර, ශ්‍රාවස්තිපුර ලිපිනයේ පිහිටි ශ්‍රාවස්තිපුර මෙටල් ක්‍රෂර් වෙතින් සම්පූර්ණ වටිනාකම රු 1,664,800.00 කට එචිප්ස් සමඟ ගල් කුඩු මිල දී ගැනීමට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**II.** **අභයපුර රන්මිණි උයන ප්‍රධාන මාර්ගයේ බෝක්කුව අසල පස් රැඳවුම් බැම්ම ඉදි කිරීම**

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත්, අභයපුර රන්මිණි උයන ප්‍රධාන මාර්ගයේ බෝක්කුව අසල පස් රැඳවුම් බැම්ම ඉදි කිරීම වෙනුවෙන් වූ රු 65411.15 ක ඇස්තමේන්තුව මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර ඉදිරිපත් කල ඇස්තමේන්තුව ප්‍රකාරව සහා අරමුදලින් කොන්ත්‍රාත් පදනමින් අභයපුර රන්මිණි උයන ප්‍රධාන මාර්ගයේ බෝක්කුව අසල පස් රැඳවුම් බැම්ම ඉදි කිරීම සුදුසු බවට මුදල් කමිටුවෙන් නිර්දේශය ලබා දෙන ලදී.

**III.** **කසල බඳුන් මිල දී ගැනීම.**

2021 වර්ෂයේ ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ සැළැස්ම යටතේ කසළ බැහැර කිරීම වෙනුවෙන් පොදු ස්ථාන වල ස්ථාපිත කිරීම සඳහා කසළ බඳුන් මිල දී ගැනීම යන ව්‍යාපෘතිය යටතේ රු 450,000 ක් වෙන් කර ඇති බැවින් ඊට අදාල කසල වෙන් කර බහාලීම සඳහා වූ බඳුන් මිල දී ගැනීම සිදු කල යුතු බවට සංවර්ධන අංශය විසින් ඉල්ලීම් කර ඇති බැවින් ඊට අදාල මිළ ගණන් කැඳවා මහ සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා 2021.02.10 වන දින මුදල් කමිටුව මගින් ලබා ගත් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා චිප්ස් සමඟ ගල්කුඩු මිල දී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීමේදී කියුබ් 2 ½ ලෙසට දක්වා තිබෙන්නේ මන්ද යන්නත්, අදාල ආයතනය මගින් ඊයේ දිනයේදී ඉදිරිපත් කර ඇති මිල වන්නේ, කියුබ් 01 සඳහා රු 6,250.00 වන බවත්, මෙහි දක්වා ඇති මිල අතර වෙනසක් පවතින බැවින් නැවත මිල ගණන් කැඳවීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී. තවද මිල ගණන් ඉදිරිපත් කර ඇත්තේ ලෝඩ් 100 ක් සඳහා බවත්, එහිදි තව දුරටත් මිල ගණන් අඩු විය යුතු බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා මෙම මිල ගණන් කැදවීම සිදු කර ඇත්තේ වෙළඳපල මිල ගණන් කැඳවීම යටතේ වුවත්, එහි වටිනාකම සමඟ සැසඳීමේදී, මෙය ජාතික තරඟකාරී මිල ක්‍රමය යටතේ පුවත්පත් දැන්වීමක පල කල යුතු බවත් මෙය නීත්‍යානුකූල විය යුතු බව සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා චිප්ස් සමඟ ගල් කුඩු මිල දී ගැනීමේදී, ප්‍රමාණය අඩු කර නැවත වෙළඳපල මිල ක්‍රමය යටතේ මිල ගණන් කැඳවීමට කටයුතු කරන බවත්, අනෙකුත් මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2021 මාර්තු මස මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය

**02. 2021 අප්‍රේල් මස සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2021 අප්‍රේල් මසට අදාලව කාර්යය මණ්ඩලය විසින් අතිකාල ඉල්ලීම් කර ඇති අතිකාල තක්සේරු වාර්ථා සභාවට ඉදිරිපත් කරමින් අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**2021 අප්‍රේල්**

| | | පැය ගණන |
|---|---|---|
| 01. ටී.එන් අමරතුංග මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 02. එච්.එම්.එස්.ඩී චන්ද්‍රසිරි මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 03. එස්.එම් මහරගෙදර මිය | (සහකාර ගිණුම් නිළධාරී) | 40 |
| 04. අයි.ජී.සී.එන් වීරකෝන් මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 05. එස්.පී.එම් පුෂ්පකුමාරි මිය | (පුස්තකාල සහයක) | 40 |
| 06. කේ.ජී.ජී.ඩී ගමගේ මිය | (පුස්තකාල සහයක) | 40 |
| 07. ඩබ් තිලකරත්න මයා | (කා.කා.ස) | 40 |
| 08. කුමුදු වාසනා වීරසිංහ මිය | (කළ සහකාර (ආවරණ) | 40 |
| 09. ඒ.ඒ පියතිස්ස මයා | (මුරකරු) | 75 |
| 10. ටී.එච්.ඩී.ඩී පෙරේරා මයා | (මුරකරු(ආවරණ) | 75 |
| 11. එම් ආර්.පෙරේරා මයා | (මුරකරු) | 75 |
| 12. ජේ.එම්.ජේ.ආර්.කේ ජයසුන්දර | (විදුලි කාර්මික) | 40 |
| 13. එස් අන්තෝනි මයා | (මාර්ග කම්කරු) | 40 |
| 14. ඩී.එම් ගුණරත්න බංඩා මයා | (කා.කා සහයක) | 75 |
| 15. සුභාෂ් ගයාෂාන් මයා | (අනියම් රියදුරු) | 40 |
| 16. පියල් බුද්ධික මයා | (අනියම් මාර්ග කම්කරු) | 40 |
| 17. බන්දුල දිසානායක | (මුරකරු ආවරණ) | 40 |

ගරු මන්ත්‍රී කේ.ජී ශාන්ත මැතිතුමා 2021 අප්‍රේල් මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති තුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සම්බන්ධව යම් විරෝධතාවයන් පවතීද යන්න විමසූ අතර කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් 2021 අප්‍රේල් මස අතිකාල ඉල්ලුම්කල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03. දිවා සුරැකුම් මධ්‍යස්ථානයට සහය පාලිකාවක් සේවයේ අවශ්‍යතාවය මත සේවයේ යොදවා ගැනීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මෙම ප්‍රාදේශීය සභාව යටතේ ක්‍රියාත්මක වන දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ මේ වන විට දරුවන් හත් දෙනෙකු සිටින අතර එක් පාලිකාවක් පමණක් සේවයේ යෙදවීම ප්‍රමාණවත් නොවන බවත්, මෙහි තාවකාලිකව සේවයේ යොදවාගෙන සිටි සහය පාලිකාව මේ වන විට මාසයක පමණ කාලයක සිට සේවයට වාර්ථා නොකිරීම හේතුවෙන් නව සහය පාලිකාවක බඳවා ගත යුතුව ඇති බවටත්, මෙම දිවා සුරැකුම් මධ්‍යස්ථානය පරිවාස දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම සඳහා අයදුම් කල අවස්ථාවේ පාලිකාවන්ගේ අධ්‍යාපන සුදුසුකම් ප්‍රමාණවත් නොවන බැවින් ලියාපදිංචි කල නොහැකි බව මා වෙත දන්වා ඇති බැවින් සම්මාන සමාර්ත දෙකක් සමඟ විෂයන් හයක් සමත් අයෙකු සේවයේ යොදවා ගැනීමට මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා දිවා සුරැකුම් මධ්‍යස්ථානය සඳහා වැටුප් ගෙවීමක් සිදු නොකරන බවට ප්‍රකාශ කලා වුවත්, ලැබෙන ආදායම ප්‍රාදේශීය සභා අරමුදලට ගැනීමෙන් පසු නැවත පාලිකාව වෙත ගෙවීම තුලින් ප්‍රාදේශීය සභාව යටතට අදාල සේවිකාව අයත් වන බවත්, දිවා සුරැකුම් මධ්‍යස්ථානය වෙත දරුවන් භාර දෙනු ලබන්නේ ඉතාම වගකීමෙන් වන බැවින් එහිදී වූ වගකීම සරල කොට ගෙන කටයුතු සිදු කල යුතු නැති බවත්, ප්‍රකාශ කරමින් ප්‍රසිද්ධ දැන්වීමක් පල කර නීත්‍යානුකූල ලෙස යම් පාලිකාවක් බඳවා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා මුදල් රෙගුලාසි 71 යටතේ තනතුරු අනුමත කිරීම සඳහා ඉල්ලීම් කර අදාල පාලිකාව බඳවා ගන්නා ලෙසත්, එහිදී සුදුසුකම් සහිත කාන්තාවක් ආත්ම අභිමානයෙන් යුතුව ලැබෙන දීමනාව සම්බන්ධයෙන් සැහිමකට පත් වන සම්මුඛ පරීක්ෂණයේදී කරුණු පැහැදිලි කර දීමකින් පසුව බඳවා ගැනීම සුදුසු බව ප්‍රකාශ කරමින් ගරු සභාපතිතුමා ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා දැනට සිටින පාලිකාව සඳහා සුදුසුකම් නොමැති වීම මත පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය නොහැකි වීම මත එමගින් ලැබෙන යම් යම් ආධාර හා වරප්‍රසාද අහිමි වී යන බැවින්, නීත්‍යානුකූල සුදුසුකම් සහිත පාලිකාවන් බඳවා ගැනීම තුල වඩාත් යහපතක් සිදු වන බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ප්‍රසිද්ධ දැන්වීමක් පල කර සම්මුඛ පරීක්ෂණයක් කැඳවා සුදුසුකම් සහිත පාලිකාවක් දිවා සුරැකුම් පාලිකාව ලෙස සේවයේ අවශ්‍යතාවය මත සේවයේ යෙදවීම සඳහා බඳවා ගැනීම සුදුසු බවට වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** **සුළු මුදල් අග්‍රිමය රු 5000 සිට රු 20,000 දක්වා වැඩි කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා කාර්යාලයේ සුළු වියදම් සඳහා දැනට සුළු මුදල් අග්‍රිමය වශයෙන් ලබා දෙන රු 5000 මුදල ප්‍රමාණවත් නොවන බැවින් සුළු මුදල් අග්‍රිමය රු 20,000 දක්වා වැඩි කිරීම සුදුසු බව ප්‍රකාශ කරමින් ඒ සඳහා සභා අනුමැතිය ලබා දිය යුතු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා සුළු මුදල් අග්‍රිමය රු 5000 සිට රු 20,000 දක්වා වැඩි කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා ගෙන එන ලද යෝජනාව කාලෝචිත බව ප්‍රකාශ කරමින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්. බී. කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්ද යන්න විමසූ අතර විරෝධතා කිසවක් ඉදිරිපත් නොවූ බැවින් සුළු මුදල් අග්‍රිමය රු 20,000 දක්වා වැඩි කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** **පොතානේගම සිඟිති පෙර පාසලේ භූමිය වටා මීටර් 39 දක්වා දුරට දැල් වැට ඉදි කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අංක 258 පොතානේගම කොට්ඨාශයට අයත් සිඟිති පෙර පාසලේ භූමිය වටා දැල් වැට ඉදි කිරීමට අදාල රු 260,122.39 ක ඇස්තමේන්තුව මහ සභාවට ඉදිරිපත් කරමින් ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුව ප්‍රකාරව සභා අරමුදලින් කොන්ත්‍රාත් පදනමින් සිඟිති පෙර පාසලේ භූමිය වටා දැල් වැට ඉදි කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ආර් එම් කුමාරසිංහ මැතිතුමා 258 පොතානේගම කොට්ඨාශයට අයත් සිඟිති පෙර පාසල් භූමිය වටා දැල් වැට ඉදි කිරීමට අදාලව ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින්, 258 පොතානේගම කොට්ඨාශයට අයත්, සිඟිති පෙර පාසලේ භූමිය වටා දැල් වැට ඉදි කිරීමට අදාල රු 260,122.39 ඇස්තමේන්තුව සභා අරමුදලින් කොන්ත්‍රාත් පදනමින් ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි කොන්ත්‍රාත් සමිතියක් හරහා සිදු කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** **ශ්‍රාවස්තිපුර කඩ කාමර අංක 01 වෙනත් පාර්ශවයක් වෙත පැවරීම.**

ගරු සභාපති එස් බී කුමාරදාස මැතිතුමා ශ්‍රාවස්තිපුර කඩ කාමර අංක 01 ලබා ගෙන ඇති බදු කරු වෙනත් ප්‍රදේශයක පදිංචි වී සිටින බැවින් මේ වන විට වසර ගණනාවක් පුරා කඩ කාමරය වසා දමා තිබෙන බවත්, පසුගිය දිනවල ඒ වන විට තිබූ හිඟ මුදල අය කර ගැනීමට කටයුතු කල බවත්, ප්‍රකාශ කරමින් දැනට පවතින තඩ කාමරය දැනට ගිවිසුම් ගත වී ඇති බදුකරු ඥාතියෙකු වෙත පැවරීමට අදාල දිවුරුම් ප්‍රකාශය සභාවට ඉදිරිපත් කරන ලදී

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා ප්‍රාදේශීය සභාව සතු යම් දේපලක් බදු ගිවිසුමක් මගින් යම් පුද්ගලයෙකු සඳහා බදු දුන් පසු එය අදාල බදුකරු හට පවත්වාගෙන යා නොහැකිනම් එම දේපල නැවත ප්‍රාදේශීය සභාවට පැවරිය යුතු වනවා මිස වෙනත් පාර්ශවයකට පැවරිය නොහැකි බැවින් ඉදිරිපත් කල ඇති දිවුරුම් ප්‍රකාශය අනුව සභාවට පවරා ගැනීමට කටයුතු කල යුතු බව සඳහන් කරන ලද අතර සභාව විසින් වෙනත් පාර්ශවයක් සඳහා බදු දෙන අවස්ථාවේදී මෙම ඉල්ලීම සළකා බැළිම සුදුස බවට යෝජනා කරන ලදී.

තවද මෙම දේපල වලට අයත්, භූමි ප්‍රාදේශීය සභාව සතු බවට ප්‍රාදේශීය ලේකම්තුමා විසින් පවරා දී නොමැති බැවින් ඊට අදාල පියවරද කඩිනමින් ලබා ගත යුතු බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා ප්‍රාදේශීය සභාව සතු කඩ කාමර සඳහා වසර 25 ක් පුරා විවිධ ගිවිසුම් සකස් කර අත්සන් කල නමුත් තිරසාර ගිවිසුමකට මෙතෙක් යා නොහැකි වීම ගැටළු සහගත වන බැවින් නව තිරසාර ගිවිසුමකට එළඹෙන්නේ නම් ගරු සභිකවරුන් ලෙස සහයෝගය ලබා දීමට කටයුතු කරන බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද යම් තක්සේරු මුදලත් යටතේ එම මුදල ගෙවා අවසන් කිරීමෙන් පසු දැනට පවත්වයාගෙන යන අයවළුන් වෙත ලබා දීම සුදුසු බවට තමාගේ අදහස බව ද සඳහන් කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ශ්‍රාවස්තිපුර කඩ කාමර අංක 01 ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමෙන් පසුව නැවත ටෙන්ඩර් කැදවා බදු පදනමින් ලබා දීම සුදුසු බවට ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා කල යෝජනාව ස්ථිර කරමින් ප්‍රාදේශීය සභාවට අයත්, භූමි ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට කටයුතු කල යුතු බවත්, ශීතාගාරය පවරා ගැනීම සම්බන්ධයෙන්ද ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් කල යුතු බවද ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ප්‍රාදේශීය සභාවට අයත් සෑම භූමියක්ම ප්‍රාදේශීය සභාවට පවරා දෙන ලෙසට පළාත් පාලන කොමසාරිස්වරයා හරහා ප්‍රාදේශීය ලේකම් වරු වෙත අවස්ථා ගණනාවක දී දැනුම් දී ඇතත්, එය මෙතෙක් ඉටු නොවූ බවත්, ශ්‍රාවස්තිපුර කඩ කාමර සඳහා යම් සැළැස්මක් ලබා දී ඒ සැළැස්මට අනුව ඔවුන් විසින්ම අදාල කඩ කාමර සකස් කර ගනිමින් එහි වටිනාකම තක්සේරු කල එය අය කර ගැනීමකින් පසුව ඔවුන්ටම හිමි කර දීම සුදුසු බවට තමන්ගේද අදහසක් පවතින බව සඳහන් කරන ලදී.

අනතුරුව ශ්‍රාවස්තිපුර කඩ කාමර අංක 01 වෙනත් පාර්ශවයක් වෙත පවරා දීම සුදහා වූ දිවුරුම් ප්‍රකාශය අනුව ප්‍රාදේශීය සභාවට පවරා ගෙන විවෘත ටෙන්ඩර් කැඳවීමකින් පසුව සුදුසු පුද්ගලයෙකු වෙත පවරා දීම සුදුසු බවට වූ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවත්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ඉදිරිපත් කල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 07. සෞභාග්‍යයේ මංපෙත් මාර්ග සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා සෞභාග්‍යයේ මංපෙත් මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය හරහා එක් තුලානයක් සඳහා රු ලක්ෂ 20 වටිනා කොන්ක්‍රීට් ඇතිරීම හා කුට්ටි ගල් ඇල්ලීමේ ව්‍යාපෘති ලබා දී ඇති බව ප්‍රකාශ කරමින් අදාල මාර්ග ලැයිස්තුව මහ සභාවට ඉදිරිපත් කරමින් අදාල ව්‍යාපෘති ප්‍රාදේශීය සභා පල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| අනු අංකය | ග්‍රාම නිළධාරී වසම | ව්‍යාපෘතිය | දිග | පළල | ව්‍යාපෘතියේ ස්වාභාවය |
|---|---|---|---|---|---|
| 01 | 264 දිවුල්වැව | පොඩිමැණිකේ මහත්මියගේ නිවස අසල සිට ආරියවතී මහත්මියගේ නිවස දක්වා මාර්ගය | 200 M | 3M | කුට්ටි ගල් |
| 02 | 268 කලුආරච්චියාගම | ඩබ්.ජයසුන්දර, සරත් චන්ද්‍රසිරි, යන මහතවරුන්ගේ නිවාස අසල සිට හා ප්‍රියන්ති මහත්මියගේ නිවසේ අසල සිට යෝධ ඇල | 200 M | 3M | කුට්ටි ගල් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | දක්වා මාර්ගය | | | |
| 03 | 269 පහළ වැව | චමින්ද මහතාගේ නිවස අසල සිට යෝධඇල දක්වා මාර්ගය | 200 M | 3M | කුට්ටි ගල් |
| 04 | 270 තුරුවිල | එන්.බී.වීරසිංහ මහතාගේ නිවස අසල සිට යූ.බී.පියසේන මහතාගේ නිවස දක්වා මාර්ගය | 200 M | 3M | කුට්ටි ගල් |
| 05 | 261 අළුත්වැව | මොරගොඩ වතුර ටැංකිය ඉදිරිපිට තුෂාර මහතාගේ නිවස මාර්ගය | 200 M | 3M | කුට්ටි ගල් |
| 06 | 263 ආමනේ | ජීවක මහතාගේ නිවස අසල සිට 2 ඇල දක්වා මාර්ගය | 200 M | 3M | කුට්ටි ගල් |
| 07 | 265 කුඩා නෙළුබැව | කුරුප්පු මහතාගේ නිවස අසල මාර්ගය | 200 M | 3M | කුට්ටි ගල් |
| 08 | 266 මහ නෙළුබැව | 10 ඇල සෝමපාල මුදලාලිගේ නිවස අසල මාර්ගය | 200 M | 3M | කුට්ටි ගල් |
| 09 | 277 කුඩා නෙළුම්කුලම | කුඩා කලත්තෑව වාහන සේවා ස්ථානය ඉදිරිපිට පාර | 200 M | 3M | කුට්ටි ගල් |
| 10 | 279 කුඩා කලත්තෑව | මිහිදු මාවත මහින්ද සර්විස් මාර්ගයේ ඉතිරි කොටස | 200 M | 3M | කුට්ටි ගල් |
| 11 | 280 තරියන්කුලම | තරියන්කුලම නළ ළිඳ අසල මාර්ගය | 200 M | 3M | කුට්ටි ගල් |
| 12 | 242 වන්නියම්කුලම I | සාලිය මාවත,ධර්මපාල මාවත සිට පාසල් මාවත දක්වා මාර්ගය | 200 M | 3M | කුට්ටි ගල් |
| 13 | 243 වන්නියම්කුලම II | ජේන් නෝනා මාවත කුට්ටිගල් අතුරා ඇති ස්ථානය සිට 9 ඇල මාවත දක්වා මාර්ගය | 200 M | 3M | කුට්ටි ගල් |
| 14 | 244 වන්නියම්කුලම III | තිස්ස මාවත කුට්ටිගල් අතුරා ඇති ස්ථානයේ සිට පෙහෙකම් මාවත දක්වා | 200 M | 3M | කුට්ටි ගල් |
| 15 | 259 ශ්‍රාවස්තිපුර | 4 ඇල සිට මල්වතු ඔයට යන මාර්ගය | 200 M | 3M | කුට්ටි ගල් |
| 16 | 260 ශ්‍රාවස්තිපු | රාජපක්ෂ මාවත | 200 M | 3M | කුට්ටි ගල් |
| 17 | 262 කිඹුලාකඩ | සුදර්ශණ මාවත IV වන පටුමග | 200 M | 3M | කුට්ටි ගල් |
| 18 | 236 සුචරිතගම | 03 වන පටුමග ක්‍රීඩා පිටිය පාර සමෘද්ධි මාවත පාලම අසල මාර්ගය | 200 M | 3M | කුට්ටි ගල් |
| 19 | 237 මහපාලාඩිකුලම | 03 වන පටුමග කුට්ටිගල් අතුරා ඉතිරි වූ කොටස | 200 M | 3M | කුට්ටි ගල් |
| 20 | 258 පොතානේගම | ඉහල වැව ඩෙස්මන් මහතාගේ නිවස අසල මාර්ගය | 100 M | 3M | කුට්ටි ගල් |
| 21 | | අක්කර 111 අනුලා මාවතෙහි දකුණු දෙසට ඇති දෙවන හරස් මාවත | 100 M | 3M | කුට්ටි ගල් |
| 22 | 275 කවරක්කුලම | විභූතිගම නාමපුවරුව අසල සිට | 200 M | 3M | කුට්ටි ගල් |
| 23 | 276 කිරික්කුලම | කිරික්කුලම පන්සල පාර මුතුබංඩාගේ නිවස අසල අතුරු මාර්ගය | 200 M | 3M | කුට්ටි ගල් |

| | | | | | |
|---|---|---|---|---|---|
| 24 | 278 නෙළුම්කන්නිය | නෙළුම්කන්නිය ප්‍රධාන මර්ගයේ සිට පන්සල දක්වා මාර්ගය | 200 M | 3M | කුට්ටි ගල් |
| 25 | 267 පාවක්කුලම | ශ්‍රී මාලි මහත්මියගේ නිවස අසල සිට ශානක මහතාගේ කඩය පසුකර | 200 M | 3M | කුට්ටි ගල් |
| 26 | 271 හිදෝගම | පිට්ටනියේ සිට කළුවිල සේන මහා විද්‍යාලය පිටු පස මාර්ගය | 200 M | 3M | කුට්ටි ගල් |
| 27 | 272 සුහදගම | සුහදගම පාලමේ සිට වසන්ත මහතාගේ නිවස මංසන්ධිය දක්වා | 200 M | 3M | කුට්ටි ගල් |
| 28 | 273 මඩවලගම | අතුරුවැල්ල කොන්ක්‍රීට් පාරේ සිට ඉදිරියට | 200 M | 3M | කුට්ටි ගල් |
| 29 | 274 උතුරු කළුවිල | 4 ඇල කොන්ක්‍රීට් පාරේ සිට ඉදිරිය | 200 M | 3M | කුට්ටි ගල් |
| 30 | 1. 245 වන්නියම්කුලම | ගුණානන්ද මාවත - ලෙනින් මාවත හරහා මාර්ගය | 200 M | 3M | කුට්ටි ගල් |
| 31 | 246 වන්නියම්කුලම V | අනුලාදේවි මාවත I පටුමග මාර්ගය | 150 M | 3M | කුට්ටි ගල් |
| 32 | 247 වන්නියම්කුලම VI | ධර්මරාජ මාවත රාහුල මාවත මාර්ගයේ ඉතිරි කොටස | 200 M | 3M | කුට්ටි ගල් |
| 33 | 1. 238 ඥාණික්කුලම | රත්නායක මාවතේ සිට අප්සරා මහත්මියගේ නිවස අසලින් පිහිටා ඇති අතුරු මාර්ගය | 200 M | 3M | කුට්ටි ගල් |
| 34 | 239 වන්නිතම්මැන්නාව | කොටසක් පාලාඩිකුලම ප්‍රධාන මාර්ගයේ සිට කසුන් මහතාගේ නිවස දක්වා දෙවෙනි අතුරු මාර්ගය | 200 M | 3M | කුට්ටි ගල් |
| 35 | 240 තම්මැන්නාකුලම | කොටසක් නව නුවරපාරේ සිට සුජික් මළුතාගේ නිවස දක්වා ගුවන් හමුදා කඳවුර අසලින් යන අතුරු මාර්ගය | 200 M | 3M | කුට්ටි ගල් |
| 36 | 241 තම්මැන්නාපුර | චින් ගෘප් ආයතනයේ සිට යසසිරිගම හරහා යන අතුරු මාර්ගය | 200 M | 3M | කුට්ටි ගල් |

<u>ගරු මන්ත්‍රී ගයාන් චාමර මැතිතුමා</u> ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි පිළිගත් ස්වෙච්ඡා සංවිධාන හරහා ගිවිසුම් අත්සන් කර අදාල ව්‍යාපෘති කොන්ත්‍රාත් පදනමින් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට වූ යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා</u> මෙම ව්‍යාපෘතිය යටතේ තොරා ගනු ලැබූ මාර්ග සම්බන්ධයෙන් අවධානය යොමු කල යුතු බවත්, මාර්ගයේ පළල සම්බන්ධයෙන් දැඩි අවධානයකට ලක් කල යුතු බව ප්‍රකාශ කරමින් ශ්‍රාවස්තිපුර කොට්ඨාශයේ රාජපක්ෂ මාවත පිළිසකර කිරීමේදී, සිදු කරනු ලබන සංවර්ධනය නොගැලපෙන බැවින් මේ සඳහා වෙනත් මාර්ගයක් යෝජනා කරන්නේනම් වඩාත් සුදුසු බවට තමන්ගේ අදහස ලෙස සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් සෞභාග්‍යයේ මංපෙත් මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ඉදිරිපත් කර ඇති මාර්ග ප්‍රාදේශීය සාභාවේ ලියාපදිංචි පිළිගත් ස්වෙච්ඡා සංවිධාන හරහා ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත් පදනමින් සිදු කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> ප්‍රාදේශීය සභාවේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පිළිගත් ස්වෙච්ඡා සංවිධානයක් මගින් ගිවිසුම් අත්සන් කිරීම සිදු කිරීමේදී එම ස්වෙච්ඡා සංවිධානය කිසි ලෙස එක් පක්ෂයකට

සීමා නොවන බවත්, යම් ගිවිසුමක් අත්සන් කිරීමක් තුල එම ස්වෙච්ඡා සංවිධානයට හිමිවන කොමිස් මුදලට බල ප්‍රදේශයේ අනෙකුත් සුභ සාධන කටයුතු වෙනුවෙන් වක්‍ර දායකත්වයක් සිදු වන බවත්, එහිදී බල ප්‍රදේශයේ මාර්ගයක් ඉදි වෙනවාට අමතරව වෙනත් සංවර්ධන කටයුත්තක්ද සිදු කරන බව බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

**10. වාහන/ යන්ත්‍ර කුලියට ලබා දීම සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2021 පෙබරවාරි මස 22 වන දින පැවති වාහන/යන්ත්‍ර කුලියට ලබා දීම සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා වූ කමිටුවේදී පහත සඳහන් නිර්දේශ ලබා ගත් අතර අදාල නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**01. ආගමික ස්ථානවල සුභසාධන කටයුතු සඳහා වාහන ලබා දීම**

බල ප්‍රදේශයේ ආගමික ස්ථානවල සුභසාධන කටයුතු සඳහා වාහන හා යන්ත්‍ර ලබා දීමේ සම්පූර්ණයෙන් නොමිලයේ ලබා දීමට කමිටුව තීරණය කරන ලදි.

**02. බැකෝ ලෝඩරය රජයේ හා ආගමික ස්ථානවල සුභසාධන කටයුතු සඳහා වාහන යෙදවීමේ කාලය**

රාජ්‍ය ආයතනයන්වල හා ආගමික ස්ථානවල සුභසාධන කටයුතු සඳහා ප්‍රාදේශීය සභාවට අයත් බැකෝ ලෝඩරය ගාස්තු රහිත ව ලබා දීමේ දී මසකට උපරිම මීටර් පැය 15 ක් පමණක් යෙදවිය යුතු බවත්, එක් ස්ථානයකට උපරිම පැය 02 ක් පමණක් ලබා දීමටත්, පැය 02 ට අමතරව වැඩ කරන කාලය සඳහා ගාස්තු ගෙවිය යුතු බවටත් නිර්දේශ විය.

**03. ජල බවුසරය**

බල ප්‍රදේශයේ අවමංගල්‍ය උත්සව සඳහා සභාව සතු ජල බවුසරය ජලය සහිත ව නොමිලයේ ලබා දීමට නිර්දේශ විය.

**04. ගලි බවුසරය**

ප්‍රාදේශීය සභාව සතු ගලි බවුසරය ආගමික ස්ථාන සඳහා පමණක් නොමිලයේ ලබා දීම සුදුසු බවට කමිටුව විසින් නිර්දේශ කර ගන්නා ලදි.

**05. ට්‍රැක්ටරය හා ටේලරය**

ට්‍රැක්ටරය හා ටේලරය ස්වේච්ඡා සංවිධාන මගින් ක්‍රියාත්මක කරනු ලබන ශ්‍රමදාන හා ආගමික ස්ථානවල සිදු කරනු ලබන සුභසාධන කටයුතු සඳහා නොමිලයේ ලබා දීමට නිර්දේශ විය.

**06. තණකොළ කපන යන්ත්‍රය**

බල ප්‍රදේශයේ සියළු ම ක්‍රීඩා පිටිවල තණකොළ කැපීම පළමු වර සම්පූර්ණයෙන්ම නොමිලයේ සිදු කිරීමට තීරණය කළ අතර, දෙවන වර තණකොළ කැපීමේ දී කමිටුව විසින් තීරණය කරන ලද මිල ගණන් යටතේ අය කිරීම සිදු කර අදාළ සේවාව සැපයීම සුදුසු බවට නිර්දේශ විය.

- බල ප්‍රදේශය තුල තණකොළ කැපීම සඳහා යන්ත්‍රය යෙදවීමේ දී පැයකට රු. 2000/= ක මුදලක් අය කළ යුතු බවට යෝජනා විය. (පැය ගණන තීරණය වනුයේ කාර්යාලයෙන් පිටත් වූ වේලාව හා නැවත කාර්යාලයට පැමිණි වේලාව අනුව ය)
- බල ප්‍රදේශයෙන් පිට තණකොළ කැපීමේ දී ප්‍රවාහනය සඳහා කි. මී. 01 ට රු. 35/= ක මුදලක් හා සේවාව සඳහා 2000/= අය කළ යුතු බවට යෝජනා විය. (පැය ගණන තීරණය වනුයේ කාර්යාලයෙන් පිටත් වූ වේලාව හා නැවත කාර්යාලයට පැමිණි වේලාව අනුව ය)

**07. රජයේ ආයතන හා ආගමික ස්ථාන වල සුහසාධන කටයුතු සඳහා වාහන ලබා දීමේ දී ගරු සභාපති තුමා බලය පැවරීම**

රජයේ ආයතන හා ආගමික ස්ථාන වල සුහසාධන කටයුතු සඳහා වාහන ලබා දීමේ දී එම කාර්යයන් පිළිබඳ සිදු කරනු ලබන ස්ථානය පරීක්ෂණයකින් පසුව තාක්ෂණ නිලධාරි ගේ නිර්දේශය මත ඒ ඒ කාර්යයන් සඳහා වාහන යන්ත්‍ර ලබා දීම සුදුසු ද යන්නත්, ලබා දෙන්නෙ නම් කොපමණ කාලයකට ද යන්න හා ආයතනයට අලාභයක් නොවන ආකාරයෙන් වාහන යෙදවීමට ගරු සභාපති තුමාට බලය පැවරිය යුතු බවත්, ඉන් පසු ගරු සභාපති තුමාගේ තීරණය මත සුහසාධන කටයුතු සඳහා වාහන ලබා දීම සිදු විය යුතු බවට ද නිර්දේශ විය.

**08. සියළු ම වාහන කුලි පදනම මත ලබා දීම.**

ප්‍රාදේශීය සභාව සතු වාහන කුලියට ලබා දීමේ දී තාක්ෂණ නිලධාරි ගේ නිර්දේශයෙන් පසු ගරු සභාපති තුමාගේ තීරණය මත කුලියට ලබා දීම සුදුසු යැයි හැඟෙන්නේ නම්, සභාව මගින් ගැසට් කර ඇති මිල ගණන් යටතේ, මුදල් කලින් ලැබීමෙන් පසු අදාළ කාර්යය සඳහා වාහනය යෙදවිය හැකි බවට නිර්දේශ කරන ලදි.

බල ප්‍රදේශයෙන් පිටත රාජකාරි සඳහා කුලී පදනම මත වාහන/ යන්ත්‍ර ලබා දීමේ බලය ගරු සභාපති තුමා වෙත පැවරීම ද සුදුසු නිර්දේශ විය.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> බල ප්‍රදේශය තුල අවමංගල්‍යා අවස්ථා දෙකක් එකවර සිදු වන අවස්ථාවක ජල බවුසරය ලබා දීමේදී ප්‍රමුඛතාවය ලබා දීමේ ගැටළුවක් මතු විය හැකි බවත්, වාහන හා යන්ත්‍ර සූත්‍ර නොමිලයේ ලබා දෙන අවස්ථාවලදී වේලාව නොසලකා යම් යම් සේවකයින් වෙත රාජකාරි කිරීමට සිදු වන බැවින් ඔවුන්ට අදාල අතිකාල ලබා දීම සම්බන්ධයෙන්ද අවධානය යොමු කල යුතු බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> බල ප්‍රදේශයේ සියළු ම ක්‍රීඩා පිටිවල තණකොළ කැපීම පළමු වර සම්පූර්ණයෙන්ම නොමිලයේ සිදු කිරීමට තීරණය කළ අතර, දෙවන වර තණකොළ කැපීමේ දී කමිටුව විසින් තීරණය කරන ලද මිල ගණන් යටතේ අය කිරීම සඳහා වූ නිර්දේශය සම්බන්ධයෙන් එකඟ විය නොහැකි බවත්, බල ප්‍රදේශයේ ක්‍රිඩා පිටි නිසි පරිදී පවත්වාගෙන යාම ප්‍රාදේශීය සභාවේ කාර්යය භාර්යයක් වන බැවින් වසරකට එක්වරක් හෝ ප්‍රාදේශීය සභාව මැදිහත් වී ක්‍රිඩා පිටියේ තණකොල කැපීම සිදු කල යුතු බව සඳහන් කරන ලද අතර පාසල් වලට අයත් ක්‍රිඩා පිටි ලෙස පවතින ක්‍රිඩාපිටිද අප විසින් තණකොළ කපා දීම සිදු කල යුතු බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා</u> බල ප්‍රදේශය තුල තණකොළ කැපීම සඳහා යන්ත්‍රය යෙදවීමේ දී පැයකට රු. 2000/= ක මුදලක් අය කළ යුතු බවට යෝජනා විය. (පැය ගණන තීරණය වනුයේ කාර්යාලයෙන් පිටත් වූ වේලාව හා නැවත කාර්යාලයට පැමිණි වේලාව අනුව ය) යන නිර්දේශය තුල දෙවරක් අය වන බවට නිරීක්ෂණය වන බැවින් ඒ සම්බන්ධයෙන් ගැටළු සහගත තත්වයක් පවතින බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා ගරු මන්ත්‍රී ගාමිණී බණ්ඩාර මැතිතුමා සඳහන් කල පරිදි, මේ කරුණ තුල යම් ගැටීමක් සිදු වන බවත්, මේ සඳහා නිවැරදි කරුණු දැක්වීමක් හෝ සංශෝධනයක් ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී. තවද ජල බවුසරය, දින කොපමණ සංඛාවක් තබා ගැනීම සඳහා අවස්ථාව ලබා දෙන්නේද යන්න විමසන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අවමංගලා අවස්ථා වලදී ජලය ලබා දීම සඳහා ජල ටැංකි 04 ක් මිල දී ගැනීමට ඉදිරියේදී කටයුතු කල හැකි බවත්, සේවකයින්ගේ අතිකාල සහා අරමුදලින් හෝ ගෙවීමට සිදු වන බවත්, ක්‍රීඩා පිටි සඳහා ගෙන ආ යෝජනාව තුල එක් වතාවක් පමණක් තණ කොළ කැපීමේදී බල ප්‍රදේශයේ ක්‍රීඩා කටයුතු සිදු කරනු ලබන ක්‍රීඩකයන් වෙතද වගකීම පැවරී යන බැවින් එහිදී ඔවුන් ක්‍රීඩා පිටියේ ක්‍රීඩා කිරීමසඳහා උනන්දු වන බවත්, පාසල් සතු ක්‍රීඩා පිටිද පළමුවර තණකොළ කපා දීමේ වැඩසටහන සඳහා දායක කර ගන්නා බවත් සඳහන් කරන ලදී.

තවද ගරු මන්ත්‍රී කුමන්ලා දෙපල සඳහන් කල පරිදි මෙහි ගාස්තු දෙවරක් අය වන බවට සඳහන් වන බැවින් ප්‍රවාහන ගාස්තුව කිලෝ මීටර් ප්‍රමාණය අනුවත්, වැඩ කරන ස්ථානයේ සිට වැඩ කරනු ලබන පැය ගණනත් ගණනය කල හැකි බවත්, පැමිණීමේදී නැවත අය කිරීමක් සිදු නොකරන බව සඳහන් කරන ලදී. ජල බවුසරය සඳහාද තිබෙන අවස්ථාව අනුව අවධානය යොමු කල හැකි බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ගයාන් චාමර මැතිතුමා 2021පෙබරවාරි මස 22 වන දින පැවති වාහන/යන්ත්‍ර කුලියට ලබා දීම සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා වූ කමිටුවේදී ලබා ගත් නිර්දේශ ක්‍රියාත්මක කිරීම ඉදිරිපත් කල සංශෝධනයන්ට යටත්ව සිදු කිරීම සුදුසු බවට ප්‍රකාශ කරමින් ගරු සභාපතිතුමාගේ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ඉදිරිපත් කල සංශෝධනයන්ට යටත්ව 2021 පෙබරවාරි මස 22 වන දින පැවති වාහන/යන්ත්‍ර කුලියට ලබා දීම සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා වූ කමිටුවේදී ලබා ගත් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**11. ශ්‍රාවස්තිපුර ආතර්ද සිල්වා ක්‍රීඩා පිටිය අසලින් දිවෙන අතුරු මාර්ගය සම්බන්ධව නිර්දේශ ලබා දීම වෙනුවෙන් පත් කල කමිටුවේ නිර්දේශ**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2021.01.25 දිනැති මහ සභාවේ තීරණ අංක 08 අනුව පත් කරන ලද කමිටුව සමඟ පැවති ක්ෂේත්‍ර පරීක්ෂාවේදී ආතර්ද සිල්වා ක්‍රීඩා පිටිය අසල අතුරු මාර්ගය සම්බන්ධයෙන් ගනු ලැබූ නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කරන ලදී.

එහිදී තහවුරු වූයේ, මෙම මාර්ගය දීර්ඝ කාලයක් පරිහරණය කර ඇති බවයි.

මෙම මාර්ගය පරිහරණය කරන, මාර්ගයේ එක් පසක පදිංචි කරුවන් සඳහාත්, ක්‍රීඩා පිටියේ වේදිකාව වෙත පිවිසීමටත් වෙනත් විකල්ප මාර්ගයක් නොමැති බැවින් මෙම මාර්ගය ඉදිරියටත් පරිහරණය කිරීම සඳහා නිදහස් කර දිය යුතු බවට නිර්දේශ විය.

දැනට ක්‍රීඩාංගනය දෙසින් සීමා මායිම් ලකුණු කර නොමැති නිසා එම සීමා මායිම් ලකුණු කිරීමටත්, ක්‍රීඩාංගනය වැඩි දියුණු කිරීමට කටයුතු කල යුතු බවත් තීරණය කරන ලදී.

මේ අනුව අනුරාධපුර කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ මාර්ග රක්ෂිතයේ සිට මාර්ගය ආරම්භ කල යුතු බවත්, පිට්ටනියේ කෙළවර දක්වාම මාර්ගය සංවර්ධනය කල යුතු බවත් තීරණය කරන ලදී.

ඒ අනුව අදාල අතුරු මාර්ගය දිග මීටර් 65 ද පළල අඩි 13 කින් ද යුතුව භාවිතය සඳහා වෙන් කිරීම සුදුසු බවට කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> ආතර්ද සිල්වා ක්‍රිඩා පිටියේ ගැටළුව සම්බන්ධයෙන් වූ අදහස මහ සභාවේදී සාකච්ඡා කරන අවස්ථාවේදී, කමිටුවක් පත් කරනු ලබන බවට ප්‍රකාශ කලත් සාමාජිකයින් නම් කිරීමක් සිදු නොකල බවත්, කිසිදු දැනුවත් වීමක් නෙවාමැතිව තමන් සමාජිකයෙකු ලෙස නම් කර ලියාපදිංචි තැපෑලෙන් කැඳවීම් ලිපියක් යොමු කර තිබූ බවත්, මෙලෙස ක්‍රියත්මක වූ කමිටුවක් තුලින් ගනු ලැබූ තීන්දු තීරණ සඳහා තමන් කිසි ලෙසකින්වත් එකඟ නොවන බව කරුණු දක්වමින් සඳහන් කරන ලද අතර යම් හෙයකින් තමන් කමිටු සාමාජිකයෙකු ලෙස පත් කර ඇත්නම් එහින් තමා ඉල්ලා අස්වන බවද සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා</u> ක්‍රිඩා පිටිය වෙනුවෙන් පත් කල කමිටුව මඟින් ලබා ගත් නිර්දේශ සඳහා තමන් එකඟ නොවන බවත්, මෙම ගැටළුව සම්බන්ධයෙන් මහ සභාවේදී සාකච්ඡා කල අවස්ථාවේදී, අවසාන තීරණයක් ලෙස මෙම කමිටුව පත් කල නමුත් ගැටළුව ඉදිරිපත් කල තමා නෙසිටින අවස්ථාවක මෙවැනි තීරණ හා නිර්දේශ ලබා ගැනීම කිසිසේත්ම සාධාරණ නොවන බව සඳහන් කරන ලදී.

තවද මෙම ක්‍රිඩා පිටියේ කොටස් වශයෙන් ඉවත් කිරීම ඉතාමත්ම අසාධාරණ බවත්, අදාල මාර්ගය ලබා දීම සිදු කල යුතු බවත්, ක්‍රීඩා පිටියද අප විසින් රැක ගත යුතු බැවින් අදාල මාර්ගය ලෙස වේදිකාව පිටුපසින් රජයට අයත්ව පවතින කොටසින් මාර්ගය ලබා දීමේ හැකියාව පවතින් බැවින් එම මාර්ගය සභාව මැදිහත් වී සකස් කර දීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා</u> අදාල කමිටුව පත් කිරීම සම්බන්ධව මහ සභාවේදී යෝජනා සම්මතයක් ලබා ගත් බවත්, මෙම මාර්ගය වෙන් කිරීම තුල ක්‍රිඩා පිටිය විනාශ කිරීමකටවත් හෝ වෙනත් ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් සිදු කල කාර්යයක් නොවන බැවින්, සාධාරණත්වය ඉටු කිරීම අපේක්ෂාව වන බව කරුණු දක්වමින් සඳහන් කරන ලද අතර නැවත කමිටුවක් පත් කර ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා සඳහන් කල රජයට අයත් කොටස පරීක්ෂා කර බලා එම කොටසින් හෝ මාර්ගය ලබා දීමට කටයුතු කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2021.03.26 වන සිකුරාදා දින සවස 2.00 ට ගරු සභාපතිතුමා ඇතුළුව, ගරු මනත්‍රි කේ.ඒ සංජීව මැතිතුමා, ගරු මන්ත්‍රි කුමුදු ප්‍රියන්ත ගුණවර්ධන මැතිතුමා, ලේකම්තුමා හා තාක්ෂණ නිළධාරීතුමා හා විෂය ලිපිකරු ඇතුලත් කමිටුව විසින් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර අදාල මාර්ගය ලබා දෙන ස්ථානය තීරණය කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ගයාන් චාමර මැතිතුමා</u> එම යෝජනාව ස්ථිර කරන ලද අතර ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් පත් කරනු ලැබූ කමිටුවේ නිර්දේශය මත අදාල මාර්ගය නිසි පරිදී නම් කිරීම සුදුසු බවට වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**12. සිව් අවුරුදු සහභාගීත්ව සංවර්ධන සැළැස්ම (LAPDP) යාවත්කාලීන කිරීම සඳහා වන උපදෙස් මාලාව - ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය(LDSP) දෙවන අධියරය**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> අභ්‍යන්තර ස්වදේශ කටයුතු සහ පළාත් පාලන අමාත්‍යාංශය, ලෝක බැංකුව හා යුරෝපා සංගමයේ සහයෝගය ඇතිව ප්‍රාදේශීය සංවර්ධන සහයෝගී ව්‍යාපෘතියේ දෙවන අධිරයේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති වලට අදාලව සකස් කරන ලද කොට්ඨාශ සැළැස්මට අනුව (අදාල කොට්ඨාශයේ මහජන ඉල්ලීම්වලට ප්‍රමුඛතාවය ලබා දෙමින් හා අදාල කොට්ඨාශයේ ප්‍රජාව හා පත් කර ගන්නා ලද ප්‍රජා කමිටු සාමාජිකයින් ) ප්‍රමුඛතා ගත කර ලද ව්‍යාපෘති මහ සභාවට ඉදිරිපත් කරමින් එම ව්‍යාපෘති අදාල ව්‍යාපෘතිය හරහා ක්‍රියාත්මක කිරීම සුදුස බවට යෝජනා කරන ලදී.

01. කවරක්කුලම මංසන්ධියේ ප්‍රාදේශීය සභා ඉඩමේ  තොග ආර්ථික මධ්‍යස්ථානය හා ශීතාගාරය ඉදි කිරීම (කඩ කාමර 15 හා වැසිකිළියක් සමඟ)
02. අනුරාධපුර කුරුණෑගල මාර්ගය දෙපස වෙළඳ කුටි 20 ක් ඉදි කිරීම
03. පහලවැව කොට්ඨාශය සඳහා නල ජලය මගින් පානීය ජලය ලබා ගැනීම (නල දිගුවක්)
04. සමස්ත පොල් වගා හිමියන් සඳහා පවුලකට පොල් ගස් 05 බැගින් (ඵලදාව ඇති) අවශ්‍ය පොහොර හා නිසි නියාමනයක් සහිතව සංවර්ධනය කිරීම.
05. 275 තුලානේ කවරක්කුලම බහු කාර්යය ගොඩනැගිල්ලේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා</u> අදාල ව්‍යාපෘතියේ ප්‍රජා කමිටු හරහා ලබාගෙන ප්‍රමුඛතාවය හිමි වී ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සුදුස බවට ගරු සභාපතිතුමා ගෙන ආ යෝජනාව සථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> මෙම ව්‍යාපෘතිවල ප්‍රමුඛතාවය වෙනස් කිරීමේ හැකියාව නැතිද යන්නත්, දැනට කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ තාවකාලිකව මේ වන විට පවත්වාගෙන යන කඩ හිමියන් ඉවත් කිරීමට කටයුතු නොකරන ලෙසත්, පහලවැව කොට්ඨාශයට ජලය ලබා දීම සඳහා වූ යෝජනාව සඳහා හැකියාව ඇත්නම් ප්‍රමුඛතාවය ලබා දී කඩිනමින් සිදු කිරීම තුල මිනිසාගේ ප්‍රධාන අවශ්‍යතාවයක් සැපිරෙන බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.හැරිසෙන්ස් මැතිතුමා</u>  තමා මීට ඉහතදී සහභාගී වූ කමිටුවකදී කොන්ක්‍රීට් මාර්ග සංවර්ධනය කිරීමේදී පළල අඩු නොකරන ලෙසට ඉල්ලීම් කල බවත්, තම කොට්ඨාශය තුල වෙද ගෙදර ආසන්නයේ වූ මාර්ගය එලෙස කොන්ක්‍රීට් කිරීම මත වාහනයක් මාරුවීමේ හැකියාව අහිමි වී ඇති බවත්, මාර්ගයේ මැද කොටසට වන්නට සිටින ජලය විණීනීම සිදු කරනු ලබන පුද්ගලයෙකු වෙත තවමත් සිය වාහනය රැගෙන යාමේ හැකියාව නොමැති බවත්, එවැනි සංවර්ධනයකට නොයා යුතු බවත්, සඳහන් කරන ලදී.

තවද කවරක්කුලම ආර්ථික මධ්‍යස්ථානය ඉදි කිරීම යහපත් කරුණක් වුවත්. ඒ තුල සිල්ලර වෙළඳාම සිදු කිරීමේදී, පාරිභෝගික ජනතාවට යහපතක් වනවා සේම ඒ තුලින් කුඩා කුඩා ප්‍රමාණයෙන් වෙළඳාම් කටයුතු සිදු කරනු ලබන පුද්ගලයින් සඳහා ද බලපෑමක් සිදු වන බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කල යුතු බවත්, ඒ තුල සිල්ලර වෙළඳාම තොග මිලටම සිදු කිරීම තුලද විශාල වෙළඳුන් පිරිසකට ගැටළු මතු කරන බවද සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා සඳහන් කල කරුණ වඩාත් නිවැරදි බවත්, මෙම ස්ථානය තොග වෙළඳාම සඳහා ආරම්භ කල බව අප සියළු දෙනා දන්නා නමුත් මෙම ව්‍යාපාරය ආරම්භ කලත්, ප්‍රදේශයේ තොග වෙළෙන්දන් මෙම ස්ථානයට ඒමට දැක්වූ මැළිකම මත ව්‍යාපාරය වසා දැමීමට ආසන්න වූ බවත්, නමුත් තමන් විසින් දැඩි වෙහෙසක් හා පාඩුවක්ද ලබමින් මෙම ව්‍යාපාරය වැසී යාමට ඉඩ නොදී පවත්වාගෙන යාමට විශාල වෙහෙසක් දැරූ නමුත් එක් අයෙක් මෙම ව්‍යාපාරය පවත්වාගෙන යාමට භාර ගත් බවත්, නමුත් අනෙක් පොළ  වෙළෙන්දන් හා සුළු වෙළෙන්දන් තවදුරටත් නොයාම මත, තොග මිලට නොව සිල්ලර මිලට පාරිභෝගිකයන් වෙත ලබා දීමට කටයුතු කල බවත්, නමුත් එය වෙනත්

ව්‍යාපාරිකයන්ගේ මිලට වඩා අඩු වන බව තමන් පිළිගන්නා බවත්, සඳහන් කරන ලද අතර LDSP ව්‍යාපෘතිය යටතේ යෝජනා වී ඇත්තේ, තොග වෙළෙන්දන් සඳහා පමණක් බවත්, ඒ සඳහා වෙනම කොන්දේසි මාලාවක් සකස් කිරීමට කටයුතු සිදු කරන බවත් සඳහන් කරන ලදී.

තවද මුල් අධියර තුලදී පීඩාවන්ට ලක් වීමට සිදු වූවත්, පසුකාලීනව වඩා දියුණු හා ආර්ථිකමය වශයෙන් වටිනා භූමියක් බවට පත් කර ගැනීමට උත්සහ කරමුයි යන්න ද ප්‍රකාශ කරන ලදී.

නැවතත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා මාර්ග කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමේ දී මාර්ගයේ පළල නිශ්චිතව තීරණය කල නොහැකිද යන්නත්, ප්‍රාදේශීය සභාව සතු මාර්ග වල ට අයත් භූමිය පවරා ගෙන මාර්ගය සංවර්ධනය කිරීම සඳහා මෙතෙක් සමත් වී නොමැති වීම සම්බන්ධයෙන් කණගාටු වන බවත්, සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා</u> පාරට අවශ්‍ය ඉඩම් කොටස් එහි පදිංචිකරුවන්ගෙන් ඉල්ලා ගැනීමේදී හා ඒවාට විසඳුම් ලබා දීමේදී ප්‍රායෝගික ගැටළු රාශියක් මතු වන නමුත් හොඳට ඉඩ තිබෙන මාර්ග එලෙස පටු වීමට ඉඩ නොතැබිය යුතු බව සඳහන් කරන ලද අතර ගරු සභාපතිතුමා විසින් මින් ඉදිරියට එවැනි සිදුවීම් වලට ඉඩ නොතබන බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> LDSP ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් හා එහි ප්‍රමුඛතාවය ලබා දෙන ආකාරය සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීම කෙලෙස සිදු කළේද යන්න ගැටළු සහගත බවත්, නිසි දැනුවත් කිරීමක් සිදු කලානම් මෙවැනි යොජනා සඳහා ප්‍රමුඛතාවය හිමි වීමේ ඉඩකඩක් නොමැති බවත්, සහභාගීත්ව සංවර්ධන සැළැස්ම සකස් කිරීමේදී මීට ඉහතදී නැ.නු.ප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේත්, නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨායේත් ප්‍රමුඛතාවය හිමි වූයේ, අතුරුවැල්ල සති පොළ භූමියේ ආර්ථික මධ්‍යස්ථානයක් ඉදි කිරීම බවත්, එහි අවශ්‍යතාවය හඳුනා ගැනීම ඉතාම වටිනා බවට එදින හඳුනාගත් බවත්, තවද ලැබී ඇති ප්‍රතිපාදන තුල අප ක්‍රියාත්මක කල යුතු වන්නේ, වඩාත්ම ගුණාත්මක තත්වයෙන් යුතු වන ඒවා බවත්, නැ.නු.ප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල උප නගරයක් ලෙස පවතින්නේ නෙළුබැව නගරය වූවත්, එය සංවර්ධනය වෙනුවෙන් උත්සහ නොකිරීම කණගාටුවට කරුණක් බවත්, මෙම සහභාගීත්ව සංවර්ධන සැළැස්මට අදාල කමිටු රැස්වීම සඳහා ගරු සභිකවරුන් වෙත සහභාගී වන ලෙසට දන්වා තිබුනත්, තමන් වෙත එවැනි කිසිදු ආරාධනාවක් හිමි වී නොතිබූ බවත්, කරුණු දක්වමින් සඳහන් කරමින් ඒ සම්බන්ධයෙන් පැහැදිළි කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

තවද රටක් සංවර්ධනයේදී මහා මාර්ග පද්ධතිය අත්‍යාවශ්‍ය වන බවත්, කුරුණෑගල පාර විශාල මාර්ගයක් වන බැවින් එම මාර්ගයේ වෙළඳ කුටි ඉදි කිරීමට කටයුතු කිරීමේදී මාර්ගයේ ඉඩ කඩ හා වාහන නැවැත්වීමේ හැකියාව ඇති ස්ථාන වල පමණක් අවධානය යොමු කිරීම අනිවාර්යෙන් සිදු කල යුතු බව සඳහන් කරන ලද අතර තමන් මේ සඳහා කිසිසේත් එකඟ නොවන බවත්, රියදුරන් අපහසුතාවයට ලක් නොවන සේ කටයුතු කිරීම සම්බන්ධව වැඩි අවධානයක් යොමු කල යුතු බව සඳහන් කරන ලද අතර මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිරිපත් වී ඇති යෝජනා සම්බන්ධයෙන් මීට වඩා හොඳ සාකච්ඡාවකට ගොස් නැවත වාරයක් ක්‍රියාත්මක කල යුතු හොඳම ව්‍යාපෘති සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ප්‍රකාශ කරමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**13.** **දැයට එළිය ව්‍යාපෘතිය යටතේ විදුලිය නොමැති නිවාස සඳහා විදුලිය ලබා දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා වත්මන් ආණ්ඩුව විසින් දැයට එළිය යන ව්‍යාපෘතිය යටතේ ලංකාව පුරා විදුලිය නොමැති නිවාස සඳහා විදුලිය ලබා දීමේ වැඩසටහන මේ වන විට ආරම්භ කර ඇති බැවින් ඊට අදාලව මෙම බල ප්‍රදේශයේ ජනතව වෙනුවෙන් වූ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා නැ.නු.ප ප්‍රාදේශීය සභාවට පවරා ඇති බැවින් 2021.03.20 වන සෙනසුරාදා දින අරුණගම ප්‍රදේශයේ නිවසකට විදුලිය ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කර සුළු උත්සවයක් පැවැත්වීමට අදහස් කර ඇති බැවින් ඒ සඳහා සියළු දෙනාම සහභාගී වන ලෙස ප්‍රකාශ කරමින් අදාල කොට්ඨාශ දෙකෙහි ලැයිස්තුව මහ සඳහාවට ඉදිරිපත් කරන ලද අතර මෙම ලැයිස්තුවේ නොමැති නම් ඇත්නම් ඉදිරිපත් කරන ලෙසද ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා මෙවැනි ව්‍යාපෘතියක් නැ.නු.ප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පමණක් නොවන මුළු ලංකාව පුරාම ක්‍රියාත්මක කිරීම සම්බන්ධව පවතින රජයට ගෞරවනීය ස්තූතිය පුද කරන බවත්, සූර්ය බල, සුළං හා ජල විදුලි ජනතා ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයක් ගරු දුමින්ද දිසානායක මැතිතුමා වෙත ලබා දීම සම්බන්ධව අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා වෙත ස්තූතිය පුද කරන බවත්, වැඩ කරන්න පුළුවන් ආමාත්‍යවරයෙකු ලෙස ඔහු විසින් ඉදිරිපත් කල සංකල්පය මේ අයුරින් ඉදිරියට යාම සිදු වන බවත්, ඔහුගේ නායකයා විදුලි බල අමාත්‍ය ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා සමඟ දුමින්ද දිසානායක මැතිතුමා ගෙන ආ මෙම සංකල්පය ගරු බැසිල් රාජපක්ෂ නැමැති ජාතික සංවිධායක වරයාගේ වැඩක් ලෙස ගෙන ගරු දුමින්ද දිසානායක අමාත්‍යාතුමා හා ගරු ඩලස් අලහප්පෙරුම අමාත්‍යවරයා ඉවත් කර සිදු කරනවානම්, එය ඉතා කණගාටු දායක බවත්, පැවතියා වූ රජය පරාජවීමට හේතු වූ කරුණු වර්ථමාන රජය පරාජය වීමට අනිවාර්යෙන් හේතු සාධක වන කරුණු හා සමාන වීමට ඉඩ කඩ පවතින බවත්, අප සියළු දෙනා සිටිය යුතු වන්නේ එක පැත්තක, එක් පන්තියක බවත්, එසේ නොමැතිව කිසිවෙකු පිනවන , හිනස්සන පන්තියක් නොව ග්‍රාමිය ජනතාවගේ පන්තිය නියෝජනය කල යුතු බවත්, මෙම සංකල්පය ගරු ඩලස් අලහප්පෙරුම අමාත්‍යතුමා හා ගරු දුමින්ද දිසානායක අමාත්‍යතුමාගේ හා අතිගරු ජනාධිපති තුමාගේ සෞභාග්‍යයේ දැක්මේ වැඩක් බවත්, අද මෙය වෙනත් පාර්ශවයක් කරා යාම සම්බන්ධයෙන් සිය බලවත් කණගාටුව ප්‍රකාශ කරමින් මෙම කරුණ මෙම ආණ්ඩුව පරාජයට පත් වීමේ ප්‍රධාන හේතුව වන බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලද අතර අතිගරු ජනාධිපති ගොඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම තුල පවතින යහපත් දැ ක්‍රියාත්මක කිරීම සඳහා ශක්තිය දෛර්ය නොවඩුව ලැබෙවා යන්නත්, අප සියළු දෙනා එක්වී එතුමා රැක නොගතහොත් මේ රට අගාදයකට වැටීම කිසි විටෙකත් වැළැක්විය නොහැකි බවත් සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධව තමා වෙත උපදෙස් ලැබී ඇති බවත්, ඒ තුල තොරණක් හා බැනරයක් ඉදි කිරීමට උපදෙස් දී තිබෙන බවත්, ඒ අනුව අතිගරු ජනාධිපති ගොඨාභය රාජපක්ෂ මැතිතුමාගේ, ගරු අග්‍රාමාත්‍යතුමාගේ හා ගරු අමාත්‍ය ඩලස් අලහප්පෙරුම අමාත්‍යවරයාගේ ඡායාරූප ඇතුලත් කරන ලෙසට දන්වා ඇති බවට සඳහන් කරමින් තමා වෙත පැවරී ඇති වගකීම නිසි පරිදි තමා ඉදිරිපත් කරන බව සඳහන් කරමින් හෙට සවස 02 අරුණගම ප්‍රදේශයේ නිවසෙක් වෙත විදුලිය ලබා දෙන බැවින් ඒ සඳහා සහභාගී වන ලෙස අවසන් වරට ප්‍රකාශ කරන ලදී.

**14.** **බ්ලොග් ගලක විකුණුම් මිළ සංශෝධනය කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ප්‍රාදේශීය සභා භූමියේ ස්ථාපිත කර පවත්වාගෙන යනු ලබන බ්ලොග් ගල් නිෂ්පාදන වැඩපල සඳහා අවශ්‍ය වන චිප්ස් සමඟ ගල් කුඩු වල මිල මේ වන විට ඉහල ගොස් පැවතීම මත දැනට සපයනු ලබන එක් බ්ලොග් ගලක නිෂ්පාදන පිරිවැය මේ වන විට ඉහග සේ ඇති බැවින් එහි විකිණුම් මිල සංශෝධනය කල යුතු බව සඳහන් කරමින් බ්ලොග් ගල් භාහිර පුද්ගලයන් වෙත විකිණීමේදී ප්‍රවාහනය සමග 16"x4"x2" ප්‍රමාණයේ එක් ගලක් රු 46 කට අවශ්‍ය ස්ථානයට ගෙන ගොස් දීමටත් ප්‍රවාහනය නොමැතිව එක් බ්ලොග් ගලක් රු 44 බැගින් ලබා දිමත් සුදුසු බවටයෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා වැඩිවන නිෂ්පාදන පිරිවැයත් සමඟ අපේක්ෂා කල අරමුණු කල ආදායම් උත්පාදන වැඩසටහන සඳහා ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිනමා ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 16"x4"x7" ප්‍රමාණයේ එක් ගලක් රු 46 කට අවශ්‍ය ස්ථානයට ගෙන ගොස් දිමටත් ප්‍රවාහනය නොමැතිව එක් බ්ලොග් ගලක් රු 44 බැගින් ලබා දිමටත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යථා පරි දි කල් දී නැති යෝජනා**

**01. කවරක්කුලම කඩ කාමර හා ජයබිම උත්සව ශාලාව බදු දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අද දින සභාවේ යථා පරිදී කල් දී නැති යෝජනා යටතේ අද දින සභාවට පැමිණ සිටින ගරු මන්ත්‍රී මණ්ඩලයේ අත්සන් සහිතව ජයබිම උත්සව ශාලාව හා කවරක්කුලම කඩ කාමර බදු දීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කර ඇති බැවින් ඒ සඳහා අවස්ථාව ලබා දෙන බවට ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා ජයබිම උත්සව ශාලාව බදු දීම සිදු කර ඇතත්, මේ වන විට අතුරු බදු දීම සිදු කර ඇති බවට සඳහන් වන බැවින් ජයබිම උත්සව ශාලාව සම්බන්ධයෙන් වන ගිවිසුම සභා ගත කරන ලෙසට ඉල්ලීම් මීට පෙර සිදු කර ඇතත්, එය මෙතෙක් සභා ගත නොකල බැවින් අද දින සභා ගත කිරීමට කටයුතු කරන ලෙසත්, කඩ කාමර බදු දීම සම්බන්ධයෙන්ද ගැටළු සහගත තත්වයක් පවතින බැවින් ඒ සම්බන්ධයෙන්ද වූ විස්තර සභා ගත කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා සියළුම කඩ කාමර හා ගිවිසුම් සම්බන්ධ විස්තර එළබෙන මහ සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා සභාව සමඟ යම් ගිවිසුමක් ඇති කර ගනු ලබන ඕනෑම අවස්ථාවක සභාවේ ගරු මන්ත්‍රී මණ්ඩලය ලෙස සියළු දෙනා දැනුවත් විය යුතු බවත්, යම් නෛතික තත්වයක් මත නඩු පවරා අධිහාරයට ලක් වූවහොත් ගරු මන්ත්‍රී මණ්ඩලය අධිහාරයට ලක් වන බවත්, අප සියළු දෙනා දැන ගත යතු බව සඳහන් කරන ලද අතර, ගිය වර මහ සභාවේදී මෙන්ම ඊට ඉහතදී ජයබිම උත්සව ශාලාවේ හා කඩ කාමර සඳහා වූ ගිවිසුම අනිවාර්යෙන්ම සභා ගත කිරීමට කටයුතු කරන බවට සඳහන් කලා වුවත් එය සභා ගත නොකල බැවින් නැවත පරිශීලනය කිරීමට අවස්ථාව සලසා දෙන ලෙසත්, සඳහන් කරන ලදී.

තවද ගරු අග්‍රාමාත්‍යතුමා ගව ඝාතනය නතර කිරීමට කටයුතු කරන බවට සඳහන් කර තිබියදී ප්‍රාදේශීය සභාව විසින් මස් කඩ බදු දීමට කටයුතු කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් තමන් කණගාටු වන බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා ගව මස් කඩ බදු දීම සම්බන්ධයෙන් කිසිදු ගැටළුවක් නොවන බවත්, ජයබිම උත්සව ශාලාව ටෙන්ඩර් කර ලබා දීම සිදු කල පුද්ගලයා සම්බන්ධයෙන් තමන් අදහස් නොදක්වන බවත්, ජයබිම උත්සව ශාලාව මේ වන විට අතුරු බදු ලබා දී ඇති බවත්, කවරක්කුලම කඩ කාමර බදු දීමේ 2017 වර්ෂයේ ගිවිසුම් වලද එකවර මාස 03 ක් කඩ කාමර බදු මුදල් නොගෙවූවහොත්, කඩ කාමර හිමියන් අසාදු ලේඛනයට ඇතුලත් වී ගිවිසුම අවලංගු කර නැවත ටෙන්ඩර් කර බදු දීමට කටයුතු කරන බවට සඳහන් වන බැවින් ඒ අනුව ඒ කාලයේදී, ප්‍රාදේශීය සභාවට පවරා ගත්තත්, 2018 වර්ෂයේදී මහ සභාවට නිවැරදි කරුණු ඉදිරිපත් කිරීමකින් තොරව නිවැරදි සභා තීරණයක් නොමැතිව කලින් ලබා දී තිබූ පාර්ශවයට නැවත

කඩ කාමර ලබා දීමට කටයුතු කල බවත්, මේ වන විට වසර 03 ක් ඉක්ම ගොසින් කිසිදු ගිවිසුමක් නොමැතිව මෙම කඩ කාමර ඔවුන් විසින් බුක්ති විදින බවට පෙනී ගොස් අති බවත් සඳහන් කරන ලද අතර, එලෙස ටෙන්ඩර් නොකර නිසි ගිවිසුමක් නොමැතිව යම් පිරිනැමීමක් සිදු කර නොමැතිනම් බෙහෙවින් වැරදි සහගත බව සඳහන් කරන ලදි.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> ජයබිම උත්සව ශාලාව තුල සිදු කර ඇතිතේ අයිතිකරුගේ කාර්යබහුලතාවය මත වෙනත් කෙනෙකු යොදවා තිබීම බවත්, බදුකරු විසින් අදාල ස්ථානයේ භාරකාරීවය පවත්වාගෙන යන බවත්, එය අතුරු බදු දීමක් නොවන බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> කිසියම් කරුණක් සම්බන්ධයෙන් නිවැරදි දැනුවත් වීමකින් කරුණු ප්‍රකාශ කරනවා විනා කිසිදු වගකීමක් රහිතව ප්‍රකාශ ඉදිරිපත් කිරීම සුදුසු නොවන බවත්, මීට ඉහතදී බදු දී ඇති 7 ඇල කඩ කාමර, ශ්‍රාවස්තිපුර කඩ කාමර බදු දී ඇති පාර්ශවයන් මේ වන විට සභාවට ගෙන්වා ගැනීමට හෝ නොහැකි තත්වයක් මත දැඩි ගැටළු මතු වන බවත්, ඇතැම් බදු කරුවන් වෙත නඩු පවරා ඇති බවත්, නඩු පරාද වූ අවස්ථාද පවතින බවත්, භූමියේ අයිතිය ප්‍රාදේශීය සභාව සතුව නැති බවත්, ගිවිසුම් අත්සන් කර නොමැති බවත්, මේ අනුව ඉතාම කණගාටු දායක ත්තවයක් පවතින බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

**ඊ) කාරක සභාවල වාර්තා**

- 2021 මාර්තු මස 05 වන දින මුදල් කමිටු වාර්ථාව
- 2021.02.22 වාහන කුලියට දීම සම්බන්ධයෙන් ප්‍රතිපත්ති තීරණය කිරීමේ කමිටු වාර්තාව
- 2021.01.25 ශ්‍රාවස්තිපුර ආතර් ද සිල්වා ක්‍රිඩා පිටිය අසල අතුරු මාර්ගය සම්බන්ධ නිර්දේශ ලබා දීමේ කමිටු වාර්ථාව

**සභා ගත කරන ලදී.**

**එ) ලැබීම් ගෙවීම් මාසික වාර්තා**

2021 ජනවාරි මස ආදායම් හා වියදම් වාර්ථා මහ සභාවේ සලකා බැලීම සිදු කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> වියදම් වාර්ථාවේ පරිපාලන වියදම්, සේවක වැටුප් , මන්ත්‍රී දීමනා හැර අනෙකුත් ගෙවීම් සඳහා විරුද්ධ වන බව සඳහන් කරන ලදී.

**ඒ) රැස්වීම් කැඳවීමේ දැන්වීම් හා වෙනත් කාරණා ඉදිරිපත් කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු සභාකවරයෙකු වෙත යම් කරුණක් සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවශ්‍යනම් ඒ සඳහා අවස්ථාව ලබා දෙන බව ප්‍රකාශ කරන ලදී.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> තාක්ෂණ කමිටුවේදී පාලම් ඉදි කිරීම් සම්බන්ධයෙන් වූ සාකච්ඡාවේදී සඳහන් කල පරිදී ගරු සභාපතිතුමා ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමාගේ හා තමන්ගේ මැදිහත් වීම මත ලබා ගත් පාලම් සියල්ල සඳහා මුල් ගල් තැබූ බවත්, ඉතාමත් කෙටි කාලයක් තුල මෙම කාර්යය ඉටු කිරීම සඳහා අවස්ථාව ලැබීම සම්බන්ධව සතුටු වන බවත් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ.ඩී.එම්.කේ.ජී.ජී කුමාරිහාමී මැතිණිය ප්‍රාදේශිය සභාවේ යම් යම් කාර්යන් සඳහා අවශ්‍ය පුටු වල යම් ගැටළුවක් පවතින බවත්, ඒ නිසා පුටු 100 මිල දී ගැනීමක් සිදු කරන ලෙසටත්, ප්‍රාදේශීය සභාව සතු පුටු සම්බන්ධයෙන් සමීක්ෂයක් සිදු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා වර්ථමාන ආණ්ඩුව බලයට පත් වී පරිසරය වෙනුවෙන් සෞභාග්‍ය දැක්ම යටතේ වැඩපිලිවෙලක් ඉදිරිපත් කලත්, මේ වන විට මාධ්‍ය තුල පරිසර විනාශය සම්බන්ධයෙන් භාග්‍ය කියන දැරිවියක් විසින් ඉදිරිපත් කරන කරුණු සඳහා ආණ්ඩුව බිය වී ඇති බව සඳහන් කරන ලද අතර ඒ අවස්ථාවේදී සභාව තුල ඇතිවූ ගෝෂාකාරී තත්වය හමුවේ අදහස් දැක්වූ කිසිවක් පැහැදිළි නොවිණි.

අනතුරුව අදහස් දැක්වූ ගරු කුමුදු ප්‍රියන්ත මැතිතුමා පරිසරය සම්බන්ධයෙන් යම් සාකච්ඡාවකට භාජනය කිරීමක් සඳහා එළබෙන මහ සභාවේදී අවස්ථාව සලසා දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ගිය වර ප්‍රාදේශීය සභා ගරු සභිකවරුන් 10 දෙනෙකු පමණක් සිට එය 21 දෙනෙකු දක්වා වැඩි කර මෙවැනි කණ්ඩායමක් සහිත මහ සභාවක් ස්ථාපිත කළේ විශාල කාර්ය භාර්යයක් අපේක්ෂාවෙන් වූ මුත්, මේ වන තෙක් වසර 03 ක් ගත වී ගොස් ඇතත්, ආපසු හැරී බලන කල අප කුමක් සිදු කර ඇත්ද යන්න සැළකිල්ලට භාජනය කල යුතු බවත්, සඳහන් කරමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා බල ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා තීන්දු තීරණ ගැනීම වෙනුවෙන් ගෞරවයෙන් සහයෝගය දැක්වූ දන්නා හා නොදන්නා කරුණ සම්බන්ධයෙන් විවිධ අදහස් සියළු දෙනාම එක්වී යහපත් චේතනාවෙන් යුතුව ඉදිරිපත් කල ගරු මන්ත්‍රීතුමන්ලා වෙත හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත ස්තුතිය ප්‍රකාශ කරමින් 2020.03.19 වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 01.20 ට අවසන් කරන ලද අතර එළබෙන මහ සභාව 2021.04.27 වන දින පෙ.ව 10.00 පැවැත්වෙන බව සඳහන් කරන ලදී.

| | |
|---|---|
| .................................... | .......................................... |
| යූ.ඒ ධම්මික, | එස්.බී කුමාරදාස මැතිතුමා |
| ලේකම්, | සභාපති , |
| නැ.නු.ප ප්‍රාදේශීය සභාව, | නැ.නු.ප්‍රාදේශීය සභාව, |
| විජයපුර. | විජයපුර. |